# ප්‍රධාන පක්ෂවල අපේක්ෂකයන් රාජ්‍ය දේපොළ ඡන්ද කටයුතුවලට යොදාගෙන

ජේ.ටී. ද සිල්වා

ප්‍රධාන දේශපාලන පක්ෂවලට අයත් අපේක්ෂකයන් විසින් ජනාධිපතිවරණ උපමාණයන් උල්ලංඝනය කරමින්, රාජ්‍ය දේපළ බහුලවම දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන් යොදාගනු නිරීක්ෂණය වන බව පැෆරල් සංවිධානය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. මේ වනවිට තම සංවිධානය වෙත ලැබී ඇති මැතිවරණ නීති උල්ලංඝනයන් විශ්ලේෂණය කර බලනවිට, පැමිණිලි 135කින් 65ක්ම එනම් සියයට 48ක් පමණ අයුතු ලෙස මහජන දේපළ සහ දේශපාලන බලය පක්ෂ හෝ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ පැමිණිලි බවද එම නිවේදනයෙහි දැක්වෙයි.

අවස්ථා ගණනාවකදීම මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ට අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන වෙත ගොස් පක්ෂ දේශපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දේශපාලන ක්‍රියාකාරකම් නැවැත්වීමට මැදිහත්වීමට සිදුවීමද මෙම තත්ත්වය සනාථ කෙරෙන තවත් උදාහරණයක් බවද එම නිවේදනය මඟින් පෙන්වාදී ඇත.

මව්බිම